# ඔබ සතු මුදල් නෝට්ටු සැබෑ නෝට්ටුදැයි තහවුරු කරගන්න

## පහත ආරක්ෂණ සලකුණු එකකට වඩා වැඩි ප්‍රමාණයක් පරීක්ෂාකර බලන්න

### 1 දිය සලකුණ

එක් එක් නෝට්ටුවේ එකිනෙකට වෙනස්වූ පක්ෂීන්ගේ රූප දැක්වෙන අතර, එම පක්ෂි රූපයම අදාළ නෝට්ටුවේ දිය සලකුණ ලෙස දක්නට ඇත. තවද නෝට්ටුවේ වටිනාකම විශේෂිත දිය සලකුණක් ලෙසින් සිරස් අතට ඉලක්කම්වලින් දක්වා ඇත.



### 2 උස්ව මුද්‍රිත ප්‍රදේශ

නෝට්ටුව මත ඇඟිලිතුඩු මගින් ස්පර්ශ කිරීමේදී උස්ව මුද්‍රිත ප්‍රදේශ හඳුනා ගත හැකිය (උදා - ශ්‍රී ලංකා මහ බැංකුව නමැති පාඨය සහිත කොටස සහ නෝට්ටුව මධ්‍යයේ පිහිටි මෝස්තර).




### 7 ඉතා කුඩා අක්ෂර

නෝට්ටුවේ සමනල රූපයට පහළ කොටස් දෙස සමීපව බැලූවිට, ඉතා කුඩා ලෙස මුද්‍රිත CBSL යන අක්ෂර දැකිය හැකිය.






### 3 උස්ව මුද්‍රිත ඉරි රටා

නෝට්ටුව දෙපස මුද්‍රිත ඉරි රටා ස්පර්ශ කිරීමේදී උස්ව මුද්‍රිත ප්‍රදේශ ලෙස හඳුනා ගත හැකිය



### 6 දෘශ්‍යාබාධිත පුද්ගලයන් වෙනුවෙන් යොදා ඇති සලකුණ

නෝට්ටුවේ වම්පස සිරස් අතට රළු ලෙස මුද්‍රිත තිත් (රු. 20 නෝට්ටුවේ එක් තිතක්) නෝට්ටුවේ වටිනාකම අනුව වැඩිවෙමින් යන ආකාරයට මුද්‍රණය කර ඇති අතර එවා දෘශ්‍යාබාධිත පුද්ගලයන්ට නෝට්ටුවල වටිනාකම හඳුනාගැනීමට උපකාරී වේ.



### 5 විනිවිද පෙනෙන සලකුණ

නෝට්ටුව ආලෝකයට යොමු කොට බැලීමේදී, නෝට්ටුවේ මුහුණත ඇති වටිනාකම සඳහන් ඉලක්කම් (සමනල රූපය අසල) නෝට්ටුවේ පිටුපස ඇති ඒ හා සමාන ඉලක්කම් සමග එකිනෙකට සමපාත වේ.



### 4 ආරක්ෂණ නූල

ආරක්ෂණ නූල නෝට්ටුවෙන් නෝට්ටුවට වෙනස් වන අතර "CBSL" යන අක්ෂර සහ අදාළ නෝට්ටුවේ වටිනාකම, Rs.20, Rs.50 .... යනාදී වශයෙන් අතුළත් කර ඇත.

රුපියල් 5000, රුපියල් 1000 සහ රුපියල් 500 යන නෝට්ටුවල පිළිවෙලින් මි.මී. 3, මි.මී.2.5 හා මි.මී. 2 ආදී වශයෙන් පළලින් යුතුවූ, රතු සහ කොළ ලෙස වර්ණය වෙනස්වන්නාවූ "ස්ටාර්ක්‍රෝම්" ආරක්ෂණ නූල තැනින් තැන මතුවී පෙනෙන ලෙස යොදා ඇත.

රුපියල් 100, රුපියල් 50 සහ රුපියල් 20 නෝට්ටුවල යොදා ඇති නූල සම්පූර්ණයෙන්ම නෝට්ටුව තුළට ඇතුල් කර ඇත.





- මුදල් නෝට්ටු හිතා මතා විකෘති කිරීම හෝ අනුකරණය කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි.
- මුදල් නෝට්ටු ප්‍රවේසමෙන් හා පවිත්‍රව පරිහරණය කර ජාතික ධනය සුරකිමු.

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව, 30, ජනාධිපති මාවත, කොළඹ 1
☎ +94 112477587 +94 112477726 @ currency@cbsl.lk